ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No

ඔබේ අංකය / உமது இல. / Your No

දිනය / திகதி / Date 2024-03-28

පැමිණිලි පාර්ශවය : ටී.සංජය මහතා,
දිනකර මාවත,
බෝම්බුවල.

වගඋත්තරකාර පාර්ශවය : 1. උ.පො.ප. තුසිත සිල්වා මහතා,
පොලිස් ස්ථානය, දොඩංගොඩ.

2. පො.කො.රි. 38478 ලංකාතිලක මහතා,
පොලිස් ස්ථානය, දොඩංගොඩ.

3. පො.කො. 51512 සමන් මහතා,
පොලිස් ස්ථානය, දොඩංගොඩ.

4. පො.ආ.ස. 343 රෝහණ ප්‍රේමකුමාර මයා,
පොලිස් ස්ථානය, දොඩංගොඩ.

**පැමිණිලි අංකය : HRC/3024/16**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ තමා, තම සොහොයුරා වන තොටගමුවගේ චාරුක යන අය සමඟ 2016.04.04 දින රාත්‍රී 10.30 -11.00 ත් අතර බෝම්බුවල, පෙම්බෘක් වත්ත මැද පාරේ තම ත්‍රීවිලය නවතා ගෙන මිතුරෙක් එනතුරු බලා සිටි බවත්, ඒ අවස්ථාවේදී දොඩංගොඩ පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ යතුරු පැදියක් එම ස්ථානයට පැමිණ "මොනවද කරන්නේ" කියා විමසූ බවත්, ඒ අවස්ථාවේදී තමා මත්පැන් පානය කර සිටි නිසා නෙඹුවනට යාමට අවශ්‍යතාවයක් තිබූ බැවින්, ඒ සඳහා මිතුරෙක් එක් කර ගැනීමට සිටින බවට පවසා සිටි බවත්ය. එහෙත් එම නිලධාරීන් එම ස්ථානයේ තමන්ට නැවතී නොසිටින ලෙසට දැනුම්දීම නිසා එම ස්ථානයේ සිට ත්‍රීවිල් රථය පණගන්වාගෙන කළුතර නැබඩ පාරට ගමන් කරනවිට පිටුපසින් පැමිණි පොලිස් යතුරු පැදියේ නිලධාරීන් පරුෂ වචනයෙන් බැණ වදිමින් නවත්වන ලෙසට අණ කළ බවත්, එම ස්ථානය ඉතා කළුවර නිසා මීටර් 15 ක් පමණ ඉදිරියට ගොස් විදුලි කණුවක් තෙක් ත්‍රීවිල් රථය පැදවූ බවත්, එවිට පොලිස් යතුරු පැදියට පිටුපසින් පැමිණි

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පොලිස් ජීප් රථයේ සිටි නිලධාරීන් විසින් තම ත්‍රීවිල් රථයට වෙඩි ප්‍රහාර 4 ක් පමණ තැබූ බවත්,** එම වෙඩි ප්‍රහාර ත්‍රීවිල් රථයේ දකුණු පැත්තට වැදුනු බවත් සඳහන් කර ඇත. ඉන්පසුව පැමිණිලිකරුගේ රථය නැවැත්වූ වහාම **පොලිස් ජීප් රථයෙන් සහ යතුරු පැදියෙන් පැමිණි පොලිස් නිලධාරීන් තමන්ට සහ තම සහෝදරයා වන තොටගමුවගේ වාරුක යන අයට පහරදුන් බවත්, තමා සහ තම සහෝදරයා හැඳ සිටි ටී ෂර්ට් ගලවා එයින් තමන් දෙදෙනාගේ මුහුණු වැසීමට කැත් කළ බවත්, පසුව ටී. සංජය වන තමාව පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්** දක්වා ඇත. ඒ අතරතුර තම සහෝදරයා විසින්, නිවසට ගොස් මවට මේ සම්බන්ධයෙන් දන්වා ඇති අතර, පැයකට පමණ පසුව තම සහෝදරයා වන තොටගමුවගේ වාරුක, මව සහ බාප්පා යන අයවළුන් පොලිසියට පැමිණි අතර, ඒ අවස්ථාවේදී පැමිණිලිකරුගේ සහෝදරයා වන තොටගමුවගේ වාරුක යන අයවද සිර මැදිරියට දැමූ බවත් සඳහන් කර ඇත.

පසු දින එනම්, 2016.04.05 වන දින උදෑසන 9.00 ට පමණ තමාව පිටතට ගෙන ප්‍රකාශයක් ලබා ගත් අතර, පැමිණිලිකරුට විරුද්ධව බීමත්ව රිය පැදවීම, අණ නොතකා ධාවනය කිරීම යටතේ නඩු පවරන බවත් "වරද පිළිනොගතහොත් උඹලාට මෙහෙ ඉන්න වෙන්නේ නැහැ"යි තර්ජණය කරන ලද බවත්, දක්වා ඇත. එම අවස්ථාවේදීම තම සහෝදරයා වෙනත් කාමරයකට ගෙන ගිය අතර, පසුව ඔහුට එරෙහිව ගංජා ළඟ තබා ගැනීම යටතේ නඩු පැවරූ බව දැනගැනීමට ලද බවද සඳහන් කර ඇත. තම සොහොයුරා යුධ හමුදාවේ කොමාන්ඩෝ බලකායේ සෙබළෙක් බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඉන්පසුව මොවුන් දෙදෙනාම 2016.04.05 දින දහවල් 12.00 ට පමණ නාගොඩ මහ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත්, අනතුරුව කලුතර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ අතර (නඩු අංක 57912) එමගින් 2016.04.08 දින දක්වා රිමාන්ඩ් බන්ධනාගාර ගත කළ බවත්, එසේම 2016.04.06 වන දින නැවත අධිකරණ වෛද්‍යවරයාට ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත.

පැමිණිල්ලට අදාළව සිදුකරන ලද 2016.10.21 දිනැති පරීක්ෂණයේදී, යතුරුපැදියේ නිලධාරීන් දෙදෙනා විසින් පැමිණිලිකරුගේ ඔළුවේ පිටුපසට සහ කන් ප්‍රදේශයට ද පිටට ද අතින් පහරදීම් කළ අතර, ඉන් පසුව ජීප් රථයේ පැමිණි නිලධාරීන් යකඩ කූරකින් තම දෙඅත් වලට පහරදුන් බවත්, ඉන් පසුව තම වම් අතට ඉතා තදබල ලෙස පහරදීමක් සිදුවූ බවත්, එමෙන්ම දෙපා වලටද පහරදීම් කළ බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත.

**පැමිණිල්ලේ සාක්ෂි :-**

තොටගමුවගේ වාරුක යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, එහි සඳහන් කර ඇත්තේ, 2016.04.04 දින රාත්‍රි 10.30 ට පමණ තමාත් තම සහෝදරයා වන තොටගමුවගේ සංජය යන අයත් ත්‍රිරෝද රථයකින් තෙඹුවන දෙසට ගමන් කරනවිට යතුරු පැදියකින් පැමිණි පොලිස් නිලධාරීන් ත්‍රීවිල් රථය නතර කරන ලෙසට අණ කළ බවත්, ඒ අවස්ථාවේදී ත්‍රීවිල් රථය සමඟ එහි පිටුපසින් පැමිණි ජීප් රථයේ නිලධාරීන් ත්‍රීවිල් රථයට වෙඩි තැබූ බවත්, පසුව තම සොහොයුරාට අමානුෂික අන්දමින් පහරදුන් බවත්, එසේ පහර දෙන්නේ ඇයිදැයි විමසූ විට තමාට ද පහරදුන් බවත්, පසුව තම සහෝදරයාව දොඩංගොඩ පොලිසියට රැගෙන ගිය බවත්ය.

**අධිකරණ වෛද්‍ය වාර්තාව :-**

පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, එම අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව බරපතල තුවාල එකක් සහිතව බරපතල නොවන තුවාල 17 ක් ඇති බවට සඳහන් වන අතර, අධිකරණ වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ රෝගියා විසින් ඉදිරිපත් කර ඇති රෝග ඉතිහාසය හා අදාළ තුවාල සැසඳෙන බවයි.

මෙහිදී ඇප ලබා ගැනීමෙන් පසුවද ප්‍රතිකාර ලබාගත් බවට පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇති නමුත්, එය තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොමැත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පළවන වගඋත්තරකාර උ.පො.ප. එච්.ආර්.තුසිත සිල්වා යන අය කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් ප්‍රකාශ කර ඇත්තේ, 2016.04.04 වන දින රාත්‍රී ජංගම සංචාර රාජකාරියේ යෙදී සිටි බවත්, එදින පො.කො. 38478 ලංකාතිලක නිලධාරියා විසින් පදවන ලද අංක 61 - 7129 දරණ ජීප් රථයෙන්, පො.කො. 51512 සමන්, පො.ආ.සහායක 343 රෝහණ යන නිලධාරීන් සමඟ ජංගම සංචාරයේ යෙදෙමින්, බීමත් රියදුරන් ස්ථානයට ඉදිරිපත් කිරීම් කළ බවත්, බීමත් රියදුරෙක් ස්ථානයට ඉදිරිපත් කොට පො.කො. 51512 සමන් නිලධාරියාට එම සැකකරු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන ලෙසට උපදෙස් දී නැවත ජංගම සංචාරයේ යෙදුනු බවත්ය. එසේ පිටව ගොස් බෝම්බුවල පෙම්බෘක් වත්ත මාර්ගයේ ගමන් කොට නාගොඩ, තෙබුවන ප්‍රධාන මාර්ගයට පැමිණීමේදී එදින රාත්‍රියේ 119 යතුරු පැදියේ සංචාරයේ යෙදී සිටි පො.කො. 55230 පීරිස් නිලධාරියා සහ පො.කො. 61808 අරුණ නිලධාරියා ත්‍රිවිල් රථයක් පසුපස ලුහුබඳින බවට තමා දුටු බවත්, එවිට වේලාව රාත්‍රී 23.40 ට පමණ වූ බවත් සඳහන් කර ඇත.

තවද, එම නිලධාරීන් ත්‍රිවිල් රථය නැවැත්වීමට පසුපසින් ගමන් කළ බවත්, එම ත්‍රිරෝද රථයේ ගමන් කළ එක් පුද්ගලයෙක් යතුරු පැදියෙන් ගමන් කරන නිලධාරීන් හට පා පහරක් එල්ල කළ බවත්, එවිට යතුරු පැදිය දකුණු අත පැත්තේ විදුලි කණුවක ගැටීමට ගොස් ඉතා අපහසුවෙන් එය වලක්වාගත් බවත්, ඒ අනුව එම සැකකරුවන් අපරාධයක් කර පළා යන අය බවට සැක කළ බැවින්, ත්‍රිවිල් රථය පසුපස හඹා ගොස් එය නවත්වන ලෙසට අණ කළ නමුත්, එම නියෝග නොතකා ත්‍රිරෝද රථය පාර පුරා ධාවනය කරමින් එය ඉස්සර කිරීමට අවස්ථාවක් ලබානොදුන් නිසා පසුපස රෝදයට වෙඩි තබන ලෙසට පොලිස් ආරක්ෂක සහායක නිලධාරියාට උපදෙස් දුන් බවත්ය. එම වෙඩි තැබීමෙන් ත්‍රිරෝද රථයේ දකුණු පැත්තේ පසුපස රෝදයට වෙඩි වැදීමෙන් පසුව මීටර් 100 ක් 150 ක් ගොස් එනම්, අධිවේගී පාලම පසු කර ගුරු පාරේ නැවති තිබූ බවත්, ජීප් රථය එම ගුරු පාරෙන් එකවරම හැරවීමට නොහැකි බැවින්, රථය හරවා එම ස්ථානයට යනවිට 119 යතුරු පැදි නිලධාරීන් හා සැකකරුවන් දෙදෙනා පොර බදිමින් සිටිනු දුටු බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී තමා ඇතුළු නිලධාරීන් සැකකරුවන් දෙදෙනාව අත්අඩංගුවට ගත් බවත්, ඔවුන් ඒ අවස්ථාවේදී බීමත්ව සිටි බවට නිරීක්ෂණය වූ බවත්, ත්‍රිවිල් රථය පැදවූ තොටගමුවගේ සංජය යන අයව මත්පැන් පරීක්ෂා කිරීම සඳහා (ඇල්කොලයිසර්) පරීක්ෂණයක් සිදුකිරීම සඳහා කටයුතු කළ බවත් දක්වා ඇත. පසුව මෙම අයට විරුද්ධව අණ නොතකා ධාවනය කිරීම, බීමත්ව රිය පැදවීම සහ පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පෑම යටතේ නඩු

පැවරූ බවත්, එසේම, ඔවුන් අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය බලය යෙදූ බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී සැකකරුවන් කළහකාරී ලෙස හැසිරුනු බැවින්, මහත් පරිශ්‍රමයක් යොදා ජීප් රථයට දමා ගත් බවත්, කිසිදු පහර දීමක් නොකළ බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**දෙවන වගඋත්තරකාර පො.කො.රි. 38478 ලංකාතිලක යන අයගේ කරුණු දැක්වීම :-**

පො.කො.රි. 38478 එච්.ඒ.ලංකාතිලක යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, තමා 2016.04.04 දින රාත්‍රි ජංගම රථයේ රියදුරු ලෙස සේවය කළ බවත්, නොනවත්වා ධාවනය වන ත්‍රිරෝද රථයක් නවත්වා ගැනීමට නිලධාරීන් විසින් කටයුතු කළ බවත්, ජංගම රථය භාරව සිටින උ.පො.ප. තුසිත මහතාගේ උපදෙස් පිට ත්‍රිරෝද රථයට වෙඩි තැබූ බවත්, එය මීටර් 100 ක් පමණ ඉදිරියට ගොස් නැවතුනු බවත්, ජීප් රථය එකවරම නවතා ගැනීමට නොහැකි වූ බැවින් ජීප් රථය ඉදිරියට ගොස් හරවා එනවිට 119 රාජකාරි කළ නිලධාරීන්, සැකකරුවන් සමඟ පොර බදිමින් සිටි බවත්ය. ඉන්පසුව ජීප් රථයේ සිටි නිලධාරීන් සැකකරුවන් අත්අංඩගුවට ගැනීමට සහය වූ බවත්, එහෙත් තමා එම සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට සහය නොවූ බවත් සඳහන් කර ඇත. පසුව එම අයව ජීප් රථයේ දමා ගත් බවත්, ඒ සඳහා තමා ජීප් රථයේ දොර ඇර ඔවුන්ව ජීප් රථයට දමා ගැනීමට සහය වූ බවත්, ඒ අවස්ථාවේදී සැකකරුවන් ඉතා අපහසුවෙන් ජීප් රථයට ගොඩ වූ බවත්, පැමිණිලිකරු දක්වන පරිදි යකඩ කුරකින් හෝ වෙනයම් අයුරකින් පහර දීමක් සිදුනොකළ බවත්, එම චෝදනා ප්‍රතික්ෂේප කරන බවත් දක්වා ඇත.

**තුන්වන වගඋත්තරකාර පො.කො. 51512 සමන් කුමාර කරුණු දැක්වීම :-**

යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, 2016.04.04 දින තමා ජංගම රථයේ සේවය කළ බවත්, දොඩංගොඩ ප්‍රදේශයේ බීමත් රියදුරන් අත්අඩංගුවට ගෙන එම රියදුරන් පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත්, මෙම පැමිණිල්ලේ සඳහන් සැකකරුව අත්අඩංගුවට ගැනීමට තමා සහභාගි නොවූ බවත්ය.

**හතරවන වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

හතරවන වගඋත්තරකාර පො.ආ.සහායක 343 රෝහණ යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, එදින උ.පො.ප. තුසිත මහතා සමඟ ජීප් රථයේ රාජකාරි කළ බවත්, කළුතර සිට තෙබුවන දෙසට වේගයෙන් ත්‍රිවිල් රථයක් ගමන් කළ බවත්, තමා ජංගම රථයේ මැද ආසනයේ සිටි බවත්, එම ත්‍රිවිල් රථය පිටුපස 119 යතුරු පැදිය ලුහුබැඳ යනු දුටු අතර, ඒ අවස්ථාවේදී උ.පො.ප. තුසිත මහතා ත්‍රිවිල් රථය පසුපස හබා යන ලෙසට ප්‍රකාශ කළ බවත්ය. ඒ අනුව කටයුතු කරමින් ත්‍රිවිල් රථය පසුපස හබා ගිය අතර, ත්‍රිවිල් රථයේ සිටි එක් අයෙක් යතුරු පැදියේ සිටි නිලධාරීන්ට පා පහරක් ගැසූ බවත්, එවිට යතුරු පැදිය ලයිට් කණුවක ගැටීමට ගොස් බේරුනු බවත්, ඉන්පසුව ත්‍රිවිල් රථය පසුපස හඹා ගිය අතර, තුසිත මහතා ත්‍රිවිල් රථය නවත්වන ලෙසට කිහිප වතාවක් කෑගැසූ බවත්, එහෙත් ත්‍රිවිල් රථය නොනවත්වා ගමන් කළ බැවින් තුසිත මහතා ත්‍රිවිල් රථයේ රෝද වලට වෙඩි තබන ලෙසට ප්‍රකාශ කළ බවත්, එවිට තමා ත්‍රිවිල් රථයේ රෝදයට වෙඩි තැබූ විට ත්‍රිරෝද රථය මීටර් 100 ක් පමණ ඉදිරියට ගොස් නැවතුනු බවත් දක්වා ඇත. එහෙත්, එකවර ජීප් රථය හරවා ගැනීමට රියදුරු මහතාට නොහැකි වූ බවත්, ඉදිරියට ගොස් රථය හරවාගෙන එනවිට 119 යතුරු පැදියේ සිටින නිලධාරීන් සමඟ සැකකරුවන්

පොර බදිමින් සිටි බවත්, පසුව ඔවුන්ව අත්අඩංගුවට ගැනීමට සහාය වූ බවත් දක්වා ඇත. එසේම පැමිණිල්ල විසින් ඔවුන්ට තමා පහරදුන් බවට තමා වෙත එල්ල කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

**පස්වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

පස්වන වගඋත්තරකාර පො.කො. 55230 වසන්ත පිරිස් යන අය කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ, 2016.04.04 දින 119 සංචාරක යතුරු පැදියේ රාජකාරි කළ බවත්, පැය 18.00 සිට උදෑසන 06.00 දක්වා එම රාජකාරියේ නියැළුනු බවත්, එම රාජකාරිය පො.කො. 61808 අරුණ යන නිලධාරියා සමග WP MH 1583 දරණ යතුරු පැදියෙන් සිදුකළ බවත්ය. එසේම රාජකාරියේ යෙදී සිටිමින් පැය 23.40ට පමණ බොම්බුවල ගොවිපළ ඉදිරිපිට රථවාහන පරික්ෂා කරමින් සිටියදී සෙම්බුවත්ත දෙසින් පැමිණි අංක ADB 1210 දරණ ත්‍රීවිල් රථයට නතර කරන ලෙසට විදුලි පන්දම් දල්වා සංඥා කළ නමුත්, අණ නොතකා ධාවනය කළ නිසා පො.කො. 61808 අරුණ යන නිලධාරියා සමඟ එම ත්‍රීවිල් රථය පසුපස හඹා ගිය බවත්, එසේ ත්‍රීවිල් රථය පසු පස හඹා ගොස් ත්‍රීවිල් රථයට කිට්ටු වන අවස්ථාවේදී එනම්, කිවුල්වත්ත හන්දියේ දී ත්‍රිවිල් රථයේ පිටුපස සිටි පුද්ගලයෙක් ත්‍රීවිල් රථයේ එල්ලී පා පහරක් එල්ල කළ බවත්, එනිසා යතුරු පැදිය පාලනය කර ගැනීමට නොහැකි වූ බවත් දක්වා ඇත.

එසේම මෙම අවස්ථාවේදී මංකඩ දෙස සිට පැමිණි ස්ථානයේ ජංගම රථයේ සිටි නිලධාරින් මෙම පහරදීම දැක ත්‍රිවිල් රථය පසුපස හඹා ගිය බවත්, පසුව කිලෝමීටර් 01 ක් පමණ ගොස් බෝම්බුවල අධිවේගී පාලම අසල දී ත්‍රිවිල් රථයේ පිටුපස රෝදයට වෙඩි තැබූ බවත් දක්වා ඇත. පසුව ත්‍රීවිල් රථයේ පුද්ගලයන් දෙදෙනා හා යතුරුපැදියේ නිලධාරින් දෙදෙනා පොර බැදීමක් සිදුකර ඇති බවත්, ඔවුන් අත්අඩංගුවට ගැනීමට උ.පො.ප. තුසිත මහතාට සහය වූ බවත් දක්වා ඇත. අත්අඩංගුවට ගත් තොටගමුවගේ සංජය යන අයව බීමත්ව රිය පැදවීම, පොලිස් අණ නොතකා ධාවනය කිරීම, පොලිස් නිලධාරීන්ට බලහත්කාරය පෑම යන වරදවල් කියා දී පැය 00.45 ට අත්අඩංගුවට ගත් බවත්, තොටගමුවගේ චාරුක යන අයව පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පෑම, ගංජා පැකට් එකක් ලඟ තබා ගැනීම හා යම් කොල්ලකෑමකට සම්බන්ධයැයි සැකපිට අත්අඩංගුවට ගත් බවත්, දක්වා ඇත. තොටගමුවගේ සංජය යන අය යුධ හමුදාවෙන් ඉවත් වූ අයෙක් බවත්, තොටගමුවගේ චාරුක යන අය යුධ හමුදාවේ විශේෂ බලකායේ සේවය කරන අයෙක් බවත් සඳහන් කර ඇති අතර, ඔවුන් හමුදා සේවයේ නියුතුවීම නිසා කිසිදු පහරදීමක් නොකළ බවත්, ඔවුන්ව අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත් දක්වා ඇත. එසේම සැකකරුවන්ට කිසිදු පහරදීමක් නොකළ බවත්, ඔවුන් පොර බදිමින් පැනයාමට උත්සාහ කළ අවස්ථාවේදී කිහිපවතාවක්ම බිම ඇද වැටුනු බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**හයවන වගකඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

හයවන වගඋත්තරකාර පො.කො. 61808 අරුණසිරි මහතා ප්‍රකාශ කර ඇත්තේ, දැනට තමා වැඩ තහනමකට ලක්ව ඇති බවත්, 2016.04.04 දින රාත්‍රී පැය 18.00 සිට පසුදින උදෑසන 06.00 දක්වා පො.කො. 55230 පීරිස් නිලධාරියා සමඟ 119 යතුරු පැදියේ රාජකාරි කටයුතු කළ බවයි. එදින බෝම්බුවල මාර්ගයේ කිවුලවත්ත ගොවිපළ අසල කිවුලවත්තට හැරෙන මාර්ගයේ යතුරු පැදිය නවතා ගමන් කරන වාහන හා පුද්ගලයන් පරීක්ෂා

කිරීම සිදුකළ බවත්, බෝම්බුවල ප්‍රධාන මාර්ගයට අවතීර්ණ වූ ත්‍රීවිල් රථයකට නලා ශබ්ද කොට විදුලි පන්දම් දල්වා නවත්වන ලෙසට අණ කළ බවත්, එහෙත් එම අණ නොතකා එම ත්‍රීවිල් රථය තේක්කහේන දෙසට ධාවනය කිරීමට යෙදුනු බවත්, ඒ අනුව වහාම ක්‍රියාත්මක වූ තමන් මෙම ත්‍රිවිල් රථය පසුපස හඹා ගිය බවත් දක්වා ඇත. තවද, කපිලවත්ත හන්දියේ ආරියපාල මුදලාලිගේ කඩය අසලදී ත්‍රිරෝද රථයට සමාන්තරව යතුරු පැදිය ගමන් කරන අවස්ථාවේදී ත්‍රීවිල් රථය නවත්වන ලෙසට අණ කළද, එය නොතකා ත්‍රීවිල් රථය ගමන් කළ බවත්, ත්‍රීවිල් රථයේ ගමන් කළ පුද්ගලයෙක් ත්‍රිවිල් රථයේ එල්ලී යතුරු පැදියට පා පහරක් එල්ල කළ බවත් සඳහන් කර ඇත. එම පා පහර නිසා යතුරු පැදිය පාලනය කර ගැනීමට නොහැකිව පාරෙන් ඉවතට පැන ලයිට් කණුවක ගැටීමට ගොස් අපහසුවෙන් එය පාලනය කර ගත් බවත්, ත්‍රිරෝද රථය ඉදිරියටම ගමන් කළ බවත්, ඒ අතර රාත්‍රි ජංගම රාජකාරියේ යෙදී සිටි උ.පො.ප. තුසිත මහතා ද එය දැක ත්‍රීවිල් රථය පසුපස හඹා ගිය බවත්, ත්‍රීවිල් රථය නවත්වන ලෙසට අණ කළ ද, එය නොතකා ඉදිරියට කිලෝමීටර් 1 ½ ක් පමණ ගිය අවස්ථාවේදී ත්‍රීවිල් රථයේ පිටුපස රෝදයට වෙඩි කිහිපයක් එල්ල කළ අතර, පසුව මීටර් 300 ක් විතර ඉදිරියට ගොස් පටු මාර්ගයක නතර වූ බවත්ය. ත්‍රීවිල් රථයේ පැමිණි පුද්ගලයින් දෙදෙනෙක් පොලිස් ග්‍රහණයෙන් මිදී පළා යාමට මහත් ආයාසයක් දැරූ බවත්, ඔවුන් අධික ලෙස මත්පැන් පානය කර සිටින බවට නිරීක්ෂණය වූ බවත්, නිලධාරින් සමඟ පොරබැදීමක් සිදුකළ බවත්, කිහිප වතාවක් ඇද වැටුනු බවත් ප්‍රකාශ කරන අතර, ත්‍රීවිල් රථයේ සිට පහරදුන් චාරුක යන අය කොමාන්ඩෝ සෙබළෙක් බවත්, ඔහු ළඟ තිබී ගංජා පැකට්ටුවක් සොයාගත් බවත්, කිසිදු අවස්ථාවක පහරදීමක් නොකළ බවත් දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිල්ලේ කරුණු දැක්වීමට අනුව, තොටගමුවගේ චාරුක යන අය සමඟ 2016.04.04 දින රාත්‍රී 10.30 -11.00 ත් අතර බෝම්බුවල, පෙම්බෑක් වත්ත මැද පාරේ තම ත්‍රීවිලය නවතා ගෙන මිතුරෙක් එනතුරු බලා සිටි බවත්, ඒ අවස්ථාවේදී දොඩංගොඩ පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ යතුරු පැදියක් එම ස්ථානයට පැමිණ "මොනවද කරන්නේ" කියා විමසූ බවත්, එම නිලධාරින් එම ස්ථානයේ තමන්ට නැවතී නොසිටින ලෙසට දැනුම්දීම නිසා එම ස්ථානයේ සිට ත්‍රිවිල් රථය පණගන්වාගෙන කළුතර නැබඩ පාරට ගමන් ගත් බවත්, පොලිස් යතුරු පැදියට පිටුපසින් පැමිණි පොලිස් ජීප් රථයේ සිටි නිලධාරීන් විසින් තම ත්‍රිවිල් රථයට වෙඩි ප්‍රහාර 4 ක් පමණ තැබීමෙන් පසු රථය නැවැත්වූ වහාම පොලිස් ජීප් රථයෙන් සහ යතුරු පැදියෙන් පැමිණි පොලිස් නිලධාරින් තමන්ට සහ තම සහෝදරයා වන තොටගමුවගේ චාරුක යන අයට පහරදුන් බවත්, තමා සහ තම සහෝදරයා හැඳ සිටි ටී ෂර්ට් ගලවා එයින් තමන් දෙදෙනාගේ මුහුණු වැසීමට තැත් කළ බවත්, පසුව ටී. සංජය වන තමාව පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් දක්වා ඇත.

තොටගමුවගේ චාරුක යන අය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයේ දක්වා ඇත්තේ, තමා තොටගමුවගේ සංජය නැමැති අය සමඟ ත්‍රීරෝධ රථයෙන් තෙඹුවන දෙසට ගමන් කරමින් සිටින විට වැල්පිටිට අධිවේගී මාර්ගය අසලදී යතුරුපැදියකින් පැමිණි නිලධාරින් තමන් ගමන්ගත් ත්‍රීරෝධ රථය නවතන ලෙසට අණ කරන ලද බවයි.

මෙහිදී පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු වල යම් පරස්පරතාවයන් පවතින බවට නිරික්ෂණය වේ.

කෙසේ වෙතත්, පැමිණිලිකරුවන්ට පහරදීමේ චෝදනාව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී, පැමිණිලිකරු වන තොටගමුවගේ සංජය යන අයට සහ තොටගමුවගේ චාරුක යන දෙදෙනාටම පහරදුන් බව දක්වා ඇති නමුත් අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් සඳහා යොමු වී ඇත්තේ, තොටගමුවගේ සංජය යන අය පමණි. ඔහුගේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල තුවාල 01 සහ බරපතල නොවන තුවාල 17 ක් පවතින බවට දක්වා ඇති අතර, එය පහත පරිදි විස්තර කර ඇත.

01. වම් අතේ සුළැගිල්ල සහ වෙදැගිල්ලට පහළින් ඇති කොටසේ අස්ථි බිදී යාමක්,
02. දකුණු ඇසට පහළින් ඇති කොටසේ තිබෙන 0.2×0.2cm ප්‍රමාණයේ තුවාලයක්,
03. වම් අතේ වැලිමිට පිටුපස ඇති 0.5×0.5cm ප්‍රමාණයේ තුවාලයක්,
04. පිටේ වම් පෙදෙසේ රේඛීයව තිරස් අතර ඇති 6cm සීරීම් තුවාලයක්,
05. පිටේ පහළ කොටසේ ඇති 1.5×1cm තුවාලයක්,
06. පිටේ වම්පස පහළ කොටසේ ඇති 1×1cm සීරීම් තුවාලයක්,
07. පිටේ දකුණු පස ඉහළ කොටසේ ඇති 1×1cm සීරීම් තුවාලයක්,
08. පිටේ දකුණුපස ඉහළින් ඇති 3×1cm වක්‍රාකාර තුවාලයක්,
09. පිටේ දකුණුපස ඉහළින් ඇති 1×1cm සීරීම් තුවාලයක්,
10. දකුණු බාහුවේ ඇති 0.2×0.3cm සීරීම් සළකුණක්,
11. දකුණු අතේ මැණික් කටුවට මදක් පහළින්, අත්ලේ ඇති 1×1cm තුවාලයක්,
12. දකුණු බාහුවේ රේඛීයව ආනතව ඇති 3cm තුවාල සළකුණක්,
13. දකුණු බාහුවේ රේඛීයව තිරස් ලෙස තිබෙන 2cm ක තුවාලයක්,
14. දකුණු බාහුවේ රේඛීයව තිරස් ලෙසට ඇති 3cm ක තුවාලයක්,
15. වම් ග්‍රිවාස්ථිය (left clavicle/collarbone) හෙවත්, වම් උරහිස් පෙදෙසේ ඇති 2×1cm තුවාලයක්,
16. දකුණු කන් පෙත්තේ ඉහළ පෙදෙසේ 1×0.5cm මතුපිට සම ඉරීමක්,
17. වම් කන් පෙත්තේ ඉහළ පෙදෙසේ 1.5×0.5cm මතුපිට සම ඉරීමක්,
18. වම් කකුලේ දණහිසට මදක් පහළින් ආනතව ඇති 2cm තුවාලයක් වශයෙන් දක්වා ඇත.

මෙහිදී වෛද්‍යවරයා වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, මෙම තුවාල සියල්ලක්ම මොට ආයුධ වලින් කළ පහරදීම් නිසා සිදුව ඇති බවත්, පළමු තුවාලය හෙවත් වම් අතේ අස්ථි බිදී යාම හැර අනෙක් සියළු තුවාල බරපතල නොවන ගණයේ තුවාල වන බවත්ය.

මෙහිදී, ඉහත සඳහන් කර අස්ථි බිදී යාම දණ්ඩ නීති සංග්‍රහයේ 311 වගන්තියේ (උ) කොටසේ, 'අස්ථියක් කැපීම හෝ භංග කිරීම හෝ අස්ථියක්, සන්ධියක් අවසන්ධි කිරීම' යටතේ බරපතල තුවාලයක් ලෙස සැළකිය හැකි බවද පෙන්වා දිය හැක.

තවද, මෙම අස්ථි බිඳීම පහරක් වැළැක්වීම සඳහා ගත් උත්සහයකදී ඇති වී ඇති බවද අංක 16 සහ 17 යන තුවාල කන් දෙක හිසෙන් ඉවතට ඇදීම නිසා ඇති වී ඇති බවද පෙන්වා දී ඇත.

පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, **යතුරුපැදියකින් පැමිණි නිලධාරීන් විසින් (මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති පරිදි යතුරුපැදියෙන් පැමිණි නිලධාරීන් වන්නේ, පො.කො 55230 පීරිස් සහ පො.කො 61808 අරුණ යන නිලධාරීන්ය) ඔහුගේ හිස පිටුපසට, කණ් ප්‍රදේශයට සහ පිටට අතින් පහරදීම් කළ බවයි.** අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කර ඇති අංක 4, 5, 6, 7, 8, 9 යන පැමිණිලිකරුගේ පිට ප්‍රදේශයට සිදුවී ඇති තුවාල සහ අංක 15 යන උරහිස ප්‍රදේශයේ ඇති තුවාලය සහ අංක 16,17 යන කන් වලට සිදුවී ඇති තුවාල, පැමිණිලිකරුගේ ප්‍රකාශය හා සැසඳෙන බව පෙනී යයි.

අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කර ඇති අංක 10, 11, 12, 14 යන දකුණු අතට සිදුවූ තුවාල සහ වම් අතේ සුළැඟිල්ලට සහ වෙදැඟිල්ලට පහළ කොටසේ අස්ථි බිඳී යාම, පැමිණිලිකරුගේ ප්‍රකාශය හා සැසඳෙන බව පෙනී යයි.

අධිකරණ වෛද්‍යවරයා විසින්ද පෙන්වා දී ඇත්තේ තුවාල වල ස්වභාවය රෝගියා විසින් ලබාදුන් පහරදීම් පිළිබඳ විස්තරය සමඟ සැසඳෙන බවයි. මෙම සියළු කරුණු සලකා බැලූ විට පැමිණිලිකාර පාර්ශවය විසින් පහරදීම පිළිබඳව ඉදිරිපත් කර ඇති විස්තරය සත්‍ය බව පෙනී යයි. ඒ අනුව මෙම තොටගමුවගේ සංජය යන පැමිණිලිකරුට පහරදීමක් සිදුව ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී, ඔහු විසින් වෛද්‍යවරයා වෙත ලබා දී ඇති ප්‍රකාශයේ ඔවුන් පොලිස් අණ නොතකා ත්‍රීවිල් රථය ධාවනය කළ බවට දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරුවන් විසින් තමන් අණ නොතකා රථය ධාවනය කළ බවට පිළිගෙන ඇති අතර, ඒ අනුව වගඋත්තරකරුවන්ට පැමිණිලිකරුවන්ව අත්අඩංගුවට ගැනීමට නීතිමය හැකියාවක් තිබෙන බවට කරුණු නිරීක්ෂණය වේ.

තවද, ජීප් රථයේ පැමිණි උ.පො.ප තුසිත සිල්වා මහතා හැර අනෙකුත් සියළු නිලධාරීන් විසින් තමාට පහරදීම් කරන ලද බවත්, යකඩ කූරකින් තම දෙඅත් වලට පහරදීම් කළ අතර, වම් අතට ඉතා තදබල පහරදීමක් සිදුකළ බවත්ය. **(සිදුකරන ලද පරීක්ෂණයේදී ඉදිරිපත් වී ඇති කරුණු අනුව උ.පො.ප තුසිත සිල්වා යන අය හැරුනුකොට ජීප් රථයේ සිටි අනෙකුත් නිලධාරීන් වන්නේ, පො.කො 3847 ලංකාතිලක, පො.කො 51512 සමන් සහ පො.ආ.ස 343 රෝහණ යන නිලධාරීන්ය.)**

පළවන වගඋත්තරකරු පහරදීමේ චෝදනාවෙන් ඉවත් වුවද, මෙම අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලියේදී කණ්ඩායම් භාර නිලධාරියා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වශයෙන් කටයුතු කර ඇති අතර, අනෙක් වගඋත්තරකරුවන් ඔහු යටතේ කටයුතු කර ඇත. තවද පො.කො 51512 සමන්කුමාර යන අය අදාළ අත්අඩංගුවට ගැනීමට සහභාගී නොවූ බවට කරුණු ඉදිරිපත් කර ඇතත්, පොලිස් ස්ථානයේ පිටවීමේ සටහන්

නිරීක්ෂණය කිරීමේදී පො.කො 51512 සමන් කුමාර නිලධාරියා උ.පො.ප තුසිත සිල්වා ඇතුළු කණ්ඩායම සමඟ අදාළ වැටළීම් කටයුතු සඳහා පිටව ගොස් ඇති බවට නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් මෙම පැමිණිලිකරුවන්ට පහර දුන් බවට ඉදිරිපත් කරනු ලබන චෝදනා ප්‍රතික්ෂේප කරන බවට දක්වා ඇත. පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ලෙන් සහ අධිකරණ වෛද්‍යවරයා වෙත ලබා දී ඇති ප්‍රකාශ අනුව, තම ත්‍රීරෝධ රථය නැවැත්වීමට පොලිස් නිලධාරීන් අණ කිරීමේදී, එම ස්ථානයෙන් මීටර් 15 ක් පමණ දුරට යන තෙක් රථය නොනැවත්වූ බවට පිළිගෙන ඇත. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා අවම බලය යෙදවීමක් එනම්, පොලිස් නිලධාරීන් හා බොරළු පොළවේ පොරබැදූ බවට වන වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම පිළිගත හැකි වුවද, එකී යොදන ලද අවම බලය තුළින් බරපතල තුවාල ගණයේ අස්ථි බිඳී යාමක් ඇතුළු තුවාල 18 ක් සිදුවීම යන කාරණය පිළිගත නොහැකි තත්වයකි. විශේෂයෙන් ගිණි අවියක්ද සන්තකයේ තිබූ පොලිස් නිලධාරීන් සිවු දෙනකු හට සිවිල් පුරවැසියන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම සඳහා ඉහත පරිදි බරපතල ගණයේ තුවාලයක් ඇතුළු තුවාල 18 ක් සිදුවීමට තරම් අවම බලයක් යෙදවීමට අවශ්‍ය වූයේද යන්න ගැටළු සහගත තත්වයකි. ඒ අනුව, තොටගමුවගේ සංජය යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ කරුණු අනුව වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කරනු ලබන පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කරනු ලබන බවට වන දැක්වීම පිළිගත නොහැකි බවට නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

පැමිණිලිකාර තොටගමුවගේ සංජය යන අයට වගඋත්තරකරුවන් විසින් පහරදී ඇති බවට පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති කරුණු, අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව තහවුරු වන අතරම බරපතල තුවාල ලෙස දක්වා ඇති වම් අතේ අස්ථි බිඳීම සිදුව ඇත්තේ, සිදුකරන ලද පහරදීම් වළක්වා ගැනීමට කටයුතු කිරීමේදී බව අධිකරණ වෛද්‍යවරයා විසින් මත ප්‍රකාශ කර ඇති අතර, පැමිණිලිකරු සඳහන් කරනු ලබන පහරදුන් ආකාරය හා තුවාල සැසඳෙන බවද තහවුරු වේ.

තවද, අධිකරණ වෛද්‍යවරයාගේ මතය අනුව රෝගියා විසින් ඉදිරිපත් කර ඇති රෝගී ඉතිහාසය ගැළපෙන බව සඳහන් වීම මතද, වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බවට තවදුරටත් තහවුරු වේ.

ඒ අනුව පැමිණිලිකාර තොටගමුවගේ සංජය යන අයගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති 'කෲර, අමානුෂික, හා අවමන් සහගත සැලකිල්ලකට හෝ දඬුවමකට භාජනය නොවීමේ' මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

1. මෙහිදී පළවන වගඋත්තරකරු විසින් පහරදීමක් සිදුනොකළ බවට පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇතත්, පළවන වගඋත්තරකාර උ.පො.ප. තුසිත සිල්වා මහතා වැටළීම් කණ්ඩායමේ කණ්ඩායම් භාර නිලධාරියා ලෙසත් ජ්‍යෙෂ්ඨ නිලධාරියා ලෙසත් කටයුතු කිරීම තුළින් අනෙකුත් නිලධාරීන් සිදුකරන වැරදි සම්බන්ධයෙන් ඔහුද වගකීමට යටත් වේ.

2. එබැවින්, පොලිස්පතිවරයා විසින් ඉහත 1-4 දක්වා වූ සියළු වගඋත්තරකරුවන්ට එරෙහිව සුදුසු විනය පියවර ගත යුතුය.

3. 1- 4 දක්වා එක් එක් වගඋත්තරකරුවන් විසින් රු. 5000/- බැගින් වූ (රු. 20,000/-) මුදලක් පැමිණිලිකරුට ගෙවිය යුතුය.

2024. 05 . 03 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව පොලිස්පති වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

03. අධ්‍යක්ෂ,
මානව හිමිකම් කොට්ඨාශය,
එන්.එම් පෙරේරා මාවත,
කොටා රෝඩ්, කොළඹ 08.
— අදාළ නිලධාරීන්ගේ නව සේවා ස්ථාන වෙත නිර්දේශය යොමු කිරීමට

**සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.** B/